සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 11 ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය - I, II

**නම/විභාග අංකය :-- ..................................................................................** **කාලය : පැය 3 යි.**

### සිංහල භාෂාව හා සාහිත්‍යය - I

**i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් ලැබේ.**
**ii. අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලදී ඇති (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.**
**iii. ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට ගැළපෙන කවය තුළ (X) ලකුණ යොදන්න**
**iv. එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති නෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.**

● අංක 1සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයේ **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

1. සාමූහිකව වැඩ කිරීමේදී නිතරම ඔහු හැසිරෙන්නේ **බළලුන් ලවා කොස් ඇට බාවන්නා සේ ය.**
   1. කිසිවකුට නොදැනෙන්නාක් මෙන්
   2. යමක් වසන් කරන්නාක් මෙන්
   3 මිතුරු වෙසින් සිට සතුරුකම් කරන්නාක් මෙන්
   4. අවදානම් වැඩක් අනෙකකු ලවා කරවා ගන්නාක් මෙන්.

2. නූගත් මිනිසෙකු වන ඔහුගේ පුරුද්ද වී ඇත්තේ අන් අයට **කත් ඇදීම ය.**
   1. අනුන්ට කතා හැදීම
   2. යටත්ව කටයුතු කිරීම
   3. අන් අය රැවටීම
   4. කපටිකම් කිරීමට මාන බැලීම

3. විවාදාත්මක අවස්ථාවන්හිදී **චවුල්වත** රැකීම සමහරුන්ගේ ස්වභාවයයි.
   1. සිතේ කැළඹුණු බව
   2. කිසිම සැලකිල්ලක් නොදැක්වීම
   3. ස්ථිර ප්‍රතිපත්තියක් නැතිකම
   4. සාධාරණය නොසලකා කටයුතු කිරීම

● **අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.**

4. විචාරශීලීව සවන්දීම යනු ඇසෙන දේ මනාව .................... කර ගනිමින් අවබෝධ කර ගනිමින් කරන ඇහුම්කන්දීමයි.
   1. ග්‍රහණය
   2. වරණය
   3. තරණය
   4. තර්කණය

5. උගත් විචාරකයා සියලු සාහිත්‍ය නිර්මාණ මධ්‍යස්ථව ................. කරයි.
   1. සමාලෝචනය
   2. විචාරය
   3. නිර්වචනය
   4. සමච්චලය

6. විචිත්‍ර හා නිරවද්‍ය භාෂා භාවිතය මෙන් ම තමාට අනන්‍ය වූ ............ අනුව රචනය සම්පාදනය වැදගත් වේ.
   1. ක්‍රමයකට
   2. භාවිතයකට
   3. තාලයකට
   4. ශෛලියකට

7. අකාරාදි පිළිවෙළ **නිවැරදි ව** දක්වෙන පද පේළිය තෝරන්න.
   1. අනුරාධපුරය, මහනුවර, සීතාවක, කෝට්ටේ
   2. කෑගල්ල, රත්නපුරය, බදුල්ල, ජයවර්ධනපුරය
   3. කුරුණෑගල, දඹදෙණිය, පොළොන්නරුව, යාපහුව
   4. අවිස්සාවේල්ල, හම්බන්තොට, මාතර, බෙලිඅත්ත

8. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
   1. අදාළ, නිර්දිෂ්ට, මර්දනය, සෙවණැල්ල
   2. එළවළු, වර්ධනය, දෘශ්ටිවිතානය, මොනරා
   3. ඓන්ද්‍රිය, ආභාෂය, සුළැඟිල්ල, පරිශිලනය
   4. වාක්කෝෂය, ලේඛකයා,ලේකම්, ව්‍යංගාර්ථ

9. එක් එක් වචනයේ දෙවෙනි අකුරෙහි ගැට **ඇලපිල්ල, පාපිල්ල, ඇදය හා ඉස්පිල්ල** අනුපිළිවෙළින් යෙදී ඇති වරණය තෝරන්න.
   1. රැහැන, තරුණ,බනිජ, මාතෘත්වය
   2. මාතෘත්වය, රැහැන, තරුණ, බනිජ
   3. තරුණ, බණිජ, මාතෘත්වය, රැහැන
   4. මාතෘත්වය, තරුණ, රැහැන, බනිජ

10. අනවශ්‍ය යන්න අයත් වන්නේ,
   1. විශේෂණ සමාසයට ය.
   2. අව්‍ය සමාසයට ය.
   3. විභක්ති සමාසයට ය.
   4. අන්‍යාර්ථ සමාසයට ය.

11. උක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
1. ලේඛිකාවක, මම, කුරුල්ලෝ, ගුරුවරු
2. රියැදුරෝ, මගීන්, දරුවෝ, ඇතෙක්
3. නිලධාරියෙක්, අපි, කාන්තාවක්, වෛද්‍යවරු
4. නීතිඥවරු, ඈ, ඔවුන්, මා

12. ''රුවනාර'' යන පදය අයත් වන්නේ කිනම් සන්ධියකට ද?
1. ස්වර සන්ධියට
2. පූර්ව ස්වර ලෝප සන්ධියට
3.ආගම සන්ධියට
4. පූර්ව රූප සන්ධියට

13. ''සෙබළුන් විසින් ත්‍රස්තවාදීහු අත්අඩංගුවට ගනු ලබති'' යන වාක්‍යයේ ත්‍රස්තවාදීහු යන්නෙහි විභක්තිය කුමක් ද?
1. කර්ම
2. කර්තෘ
3 කරණ
4. ප්‍රථමා

● 14 සිට 16 තෙක් ඇති ප්‍රශ්නවල **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.

14. දැනුම ශීඝ්‍ර ලෙස වෙනස් වන ලෝකය තුළ සෑම පුද්ගලයකු ම **යාවත්කාලීන** වීමට උත්සාහ ගත යුතු ය.
1. විචාරශීලී
2. අදට ගැළපෙන
3. සමාජශීලී
4. දිවි ඇති තෙක්

15. විමලරත්න කුමාරගම කවියාට සාර්ථක කවි නිර්මාණ කිරීමට හැකි වූයේ ජන **විඥානය** හඳුනා ගත් නිසයි.
1. සාමාන්‍ය දැනුම
2. පෞද්ගලික දැනුම
3. විශේෂ දැනුම
4. අසාමාන්‍ය දැනුම

16. 'ම' යනු **ඕෂ්ටජ** අක්ෂරයකි.
1. තොල්වලින් හට ගන්නා
2. දත්වලින් හටගන්නා
3. උගුරෙන් හටගන්නා
4. තල්ල මුදුනින්

17. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් **නො වන** පදයක් සහිත වරණය තෝරන්න.
1. සන්ධි - සුරත, නිරවුල්, උනුන්, අස්සන
2. ප්‍රයෝජ්‍ය ක්‍රියා - නළවයි, නටවයි, බලවයි, කරවයි
3. සමාස - දසබල, සුමිහිරි, රටවැසි, නිල් මහනෙල්
4. තද්ධිත - පුතණු, නාගරික, ගුණවත්, ගැමි

18. දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමග බැඳී **නො පවත්නා** පද පේළිය තෝරන්න.
1. එකතු කිරීම, අඩු කිරීම, බෙදීම, ගුණ කිරීම
2. කථනය, කියවීම, ලිවීම, ශ්‍රවණය
3. පදරචනය, තනුව, සංගීතය, ගායනය
4. කියත, නියන, යතුකැටය, ලඔය

19. එක් එක් පද පේළියේ දී ඇති පදවලට **සමානාර්ථ යෙදුම් පමණක්** ඇතුළත් පද පේළිය තෝරන්න.
1. ත්‍යාග - තිළිණ, තීරණය - නිගමනය, දක්ෂ - චතුර, දෙනෙත - උපැස්
2. නිතර - සතත, පස්වරුව අත්වාරුව, අලුයම අරුණ, පිපුණු - විකසිත
3. ගෞරවය - ගරුත්වය, අනූන අඩුනැති, අධිවාසනා - ඉවසීම , තත්පර - නිරත
4. පොත - පුස්තකය, බබළන - දිලිසෙන, මසුරු - අසරු, මිදුණු - මුක්ත

20. මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් නො දෙන පදයක්** ඇතුළත් වරණය තෝරන්න.
1. මොනරා - මියුරු, නිල්ගල, පිල්බර, බක
2. පාර - පෙත, මං, මග, මාවත
3. ගස - දැමය, පාදප, වෘක්ෂ, තුරු
4. නිදහස් අදීන, නිවහල්, ස්වතන්ත්‍ර, ස්වාධීන

21. **විරුද්ධාර්ථවත්** පද යුගලයක් නොවන වරණය තෝරන්න.
1. අනුමාන - නිරනුමාන
2. කාලික - අකාලික
3. අනුවර්තනය - පරිවර්තනය
4. චාරිත්‍ර - වාරිත්‍ර

22. **මිශ්‍ර ක්‍රියාවක්** යෙදී ඇති වරණය තෝරන්න.
1. දරුවා බත් කමින් මහහඬින් අඬයි.
2. ඈ කඩිනමින් කඩේට ගියා ය.
3. හස්තියා පෙරහරෙහි සෙමින් ගමන් කරයි.
4. සාමය ඇති කිරීමට ඉක්මනින් පියවර ගත යුතු බව කාදිනල්තුමා පවසයි.

23. **වැරදි** අදහස දෙන වාක්‍යය තෝරන්න.
1. ආඛ්‍යානයක ප්‍රත්‍යයට පෙර 'ව' යෙදුණු පමණින් ප්‍රයෝජ්‍ය ක්‍රියාවක් නොවේ.
2. 'ගියා ය' යනු අතීත කාල ස්ත්‍රී ලිංග ඒක වචන ක්‍රියා පදයකි.
3. මළල ක්‍රීඩා යන්න මලල ක්‍රීඩා යනුවෙන් නිවැරදි විය යුතුයි.
4. වචනයක 'ශ' යන්නට පසුව 'ණ' යන්න පමණක් යෙදේ.

24. ඝෝෂ අක්ෂර **පමණක්** අන්තර්ගත වරණය තෝරන්න.
1. කර 2. ජය 3. වට 4. කය

25. පහත දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන නගර නාමය ඇතුළත් වරණය තෝරන්න.
1. පොන්රුළොවනන 2. ලගකුණෑරුලකු 3. පුනුධයඅරරා 4. යන්ටනොටියටිය

● අංක **26** හා **27** තෙක් ප්‍රශ්න යටතේ දී ඇති ප්‍රස්තාව **පිරුළුවලට වඩාත් ගැළපෙන** අදහස සහිත වරණය තෝරන්න.

26. ගඟෙන් දිය බී මුහුදට ආවඩන්නා සේ
1. බලය අඩු කෙනකුගෙන් උපකාර ලැබ බලය ඇති කෙනකුට පැසසීම
2. වරද කරන්නාගෙන් පිහිට ලැබීම
3. තමනුත් ප්‍රයෝජන නො ගෙන අනුන්ටත් ප්‍රයෝජන ගැනීමට ඉඩ නො දීම
4. ප්‍රයෝජනයක් නැති වැඩක් සඳහා වෙහෙසීම

27. අතු කඩා මොරකන්නා සේ
1. ලාභය තකා යමක් අමතක කිරීම 2. වරද කරන්නාගෙන් පිහිට පැතීම
3. ලෝකයට සුදනෙකි, ගෙදරට දුර්ජනයෙකි. 4. අය මාර්ග මුළුමනින් ම නැති කර ගැනීම

28. A ළිංවතුර - ස්වරාදේශ සන්ධිය B කොග්ගල - පරරූප සන්ධිය
C කම්මල - ස්වර සන්ධිය D දුන්න - ද්විත්ව රූප සන්ධිය
A,B,C,D, යෙදුම් අතරින් නිවැරදි වන්නේ,
1. A හා B පමණි 2. B හා D පමණි 3. C හා D පමණි 4. D හා A පමණි

● **29 හා 30 යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.**

29. 1. දරුවෝ හොඳින් ඉගෙන ගනිති යි දෙමව්පියෝ සිතති.
2. දරුවෝ හොඳින් ඉගෙන ගනිති යි දෙමව්පියන් සිතති.
3. දරුවන් හොඳින් ඉගෙන ගනිති යි දෙමව්පියෝ සිතති.
4. දරුවන් හොඳින් ඉගෙන ගනිති යි දෙමව්පියන් සිතති.

30. 1. අතීතයේදී සිංහල අපි විවිධ ජාතිකයින් හා මිත්‍රත්වයෙන් සිටියෙමු.
2. අම්මාවරු සමග දරුවෝ පාසල් යති.
3. අපි නොහොත් ඔවුහු පසුගිය සතියේ ශ්‍රමදානයක් පැවැත්වූහ.
4. ඔවුන් දෙවිවරු වැනි වෛද්‍යවරු වූහ.

31. A පොලීසියට සහාය වීම ........... ආරක්ෂා හමුදා කැඳවූහ.
B සූර්යයා ................. දිනිඳු ලොවට මූලික ශක්තිය ලබා දෙයි.
C දෙමව්පියෝ ............... දරුවෝ පන්සල් පැමිණිය හ.
D මවක් දරුවා ................ ළඳරු පාසලට යයි.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?

E හෙවත් F කැටුව G පිණිස H හා
1.F,G,E,H 2. E,F,G,H 3. H,E,F,G 4. G,E,H,F

32. පහත දැක්වෙන වාක්‍ය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
''මං දවසට පාරක් සෙයිලමට යනවා.''
1. මම දිනකට තෙවරක් නගරයට යමි. 2. මම දිනකට එක් වරක් නගරයට යමි
3. මම හැමදාම නගරයට යමි 4. මම හැමදාම එක පාරක් නගරයට යමි.

33. 'සෙංකොට්ටං' නමැති නවකතාව
1. මහගම සේකරගේ ය. 2. ගුණදාස අමරසේකරගේ ය.
3. මහින්ද ප්‍රසාද් මස්ඉඹුලගේ ය. 4. කේ. ජයතිලකගේ ය.

34. **රූපකයක් රහිත** වරණය තෝරන්න.
1. සැඳෑ සඳුට සදමින් මග නිසා කත 2. දිනිඳු හිමි විලඹුවෝ
3. නිල් කුරුලු බිළිඳු නිදි ඇහැරවන්නේ කුමට 4. මෙවුල් දම බමර කිකිණි.

35. 'පෙදෙහි රසහව් විඳුනා දෙනෙතා ඉතා දුලබෝ' යන පාඨයෙහි 'දෙනෙතා' යන වචනයේ අර්ථය කුමක් ද?
   1. දෙනෙත්   2. දැත   3. ග්‍රන්ථ   4. ජනතාව

36. පහත සඳහන් කවියේ තුන් වැනි පදය තෝරන්න.

    විදෙන ලෙළන නරු බර පුළුලුකුළ  රැඳී
    හෙළන නගන අත නුවනග බැලුම් ගත  දිදී
    ....................................................................................
    සැලෙන පහන සිළු වැනි රඟන ලිය  සැදී

   1. පුවළ සිහළ දළ බළ මුළු නිති  වොරැදී   2. රුවින දිලෙන අබරණ කැලුම  යෙදී
   3. වෙරළ ඉගිළ තුළ රළ වැළ දිදී  රිදී   4. රසෙයි අමා රසමය ඒ පියස  රිදී

37. ''ඒක නොවෙයි මහාධිකරණතුමනි, ප්‍රශ්නය මේ මවගෙ හදවත ඇතුළත බුර බුරා නගින දුක්ගින්දරයි'' මෙම සංවාද ඛණ්ඩය ඇතුළත් නාට්‍ය කුමක් ද?
   1. හුණුවටයේ කතාව   2. සිංහබාහු   3. මනමේ   4. තලමල පිපිලා

38. දිගාමඩුලු ජනවහරෙහි 'බෝල්ලු' යනු
   1. සපත්තු   2. වලස්සු   3. එළ හරක්   4. මී හරක්

39. සාර පලය අඹ දඹ රඹ ද  වල්පිට
    මීර ජලය ඇළ දොළ කඳු පිටින්  බට
    නැර ලොලය වඩවන දුටු දනන්  තුට
    කැරගලය වැජඹෙයි මේ ලෙසින්  සිට
    යන කවියෙන් ඉස්මතු වන අර්ථාලංකාරය වන්නේ,
   1. අතිශයෝක්තියයි   2. උත්ප්‍රේක්ෂාලංකාරයයි   3. ස්වභාවෝක්තියයි   4. වක්‍රෝක්තියයි

40. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන වරණය තෝරන්න.
   ''සඳැස් කාව්‍යයක විරිතක් දක්නට ලැබෙන අතර නිසඳැසක දක්නට ලැබෙන්නේ පද සංඝටනාව අනුව ජනනය වන ලයකි. විරිත ගොඩනගා ගනු ලබන්නේ පද්‍ය පාදයේ යොදා ගන්නා මාත්‍රා ගණන අනුවයි''
   1. සඳැස් කාව්‍යයක හා නිසඳැස් කාව්‍යක විරිත හා ලය අතර පවතින වෙනස පිළිබඳවයි.
   2. සඳැස් කාව්‍යක් හා නිසඳැස් කාව්‍යක් අතර පවතින ප්‍රධාන වෙනස පිළිබඳවයි.
   3. සඳැස් කාව්‍යක හා නිසඳැස් කාව්‍යක මාත්‍රා ගණන අතර පවතින වෙනස පිළිබඳවයි.
   4. සඳැස් කාව්‍යක හා නිසඳැස් කාව්‍යක පද සංඝටනාව අතර පවතින වෙනස පිළිබඳවයි.

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 11 ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය - I, II

**නම/විභාග අංකය :-- ..................................................................................**

## සිංහල භාෂාව හා සාහිත්‍යය - II

♦ **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.**

01. **අංක (1) සිට (10) තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(1) පහත සඳහන් පදවල අදහස් පැහැදිලි වන සේ වාක්‍ය තනන්න.
(අ) කල (ආ) කළ

(2) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර නැවත ලියන්න.
හැඩයෙන් අඩ සඳකට සමාන නිසා සඳකඩ පහන නමින් හැඳින් වූ මෙය පැරණි මූර්ති කැටයම් කලා ශිල්පියාගේ කලා කෞෂල්‍යය විදහා පාන්නකි.

(3) පහත සඳහන් පද සන්ධි කොට සන්ධි වර්ගය ලියන්න.
(අ) පත් + ඉරු (ආ) දකුණු + අත

(4) පහත සඳහන් වාක්‍යයෙහි ඇතුළත් උපසර්ග පද දෙකක් උපුටා දක්වන්න.
ක්‍රීඩාව මගින් ලැබෙන කායික නිරෝගී බව කෙනෙකුගේ මානසික වර්ධනය කෙරෙහි සුවිශේෂී ව ම බලපායි.

(5) පහත දැක්වෙන පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.
(අ) සංකෝචනය (ආ) සම්මානය

(6) පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියා දක්වන්න.
(අ) පමණ මෙතෙකැ යි දැක්විය නො හැකි. (ආ) පරම්පරාවෙන් උරුම වූ අයිතිය

(7) පහත දැක්වෙන වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.
(අ) නුඹලා විභාගයෙන් ජය ලබත්වා!
(ආ)සුදුසුකම් සම්පූර්ණ කළ උපාධිධාරීහු අටසිය දෙනෙකු ගුරු පත්වීම් ලැබූ හ.

(8) පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පද අයත්වන ක්‍රියා වර්ගය නම් කරන්න.
(අ) **කියග** මගිය එනු කොහි සිට දද සමනොළ ගොසිනා
(ආ) පුරඹර **වසමින්** සිටි රඟ කුම් වැනි

(9) පහත සඳහන් යෙදුම්වල පළමු වැනි වචනය සමඟ දෙවැනි වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමු වැනි වචනය හෝ දෙවෙනි වචනය හෝ සකස් කර ලියන්න.
(අ) පුරාණ සිරිත් (ආ) ජ්‍යේෂ්ඨ පුත්

(10) පහත දැක්වෙන වාක්‍යයේ ඇතුළත් යුගල පද දෙපා තෝරා වෙන වෙන ම ලියන්න.
ශ්‍රී ලාංකික ලොකු කුඩා බොහෝ දෙනා කිරිපිටි සඳහා හුරු පුරුදු වී ඇති බව සමීක්ෂණයකින් හෙළි වී තිබේ.

(2x10=20)

02. පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන වචන 250 කට නො අඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(1) අද අපේ රට තුළ පවත්නා නොමිනිස්කම්, පුද්ගල ඝාතන හා ගැටුම් ආදියට මූලික හේතුව එකිනෙකා අතර පවත්නා අන්‍යෝන්‍ය අවබෝධය පළුදු වීමයි. රටක ඉදිරි පැවැත්ම තීරණය වීමට ආගම, දහම ප්‍රධාන සාධකයක් වේ. ඒ මගින් රටත් ශ්‍රී ලාංකේය ජාතියත් ගැටුම්වලින් තොර නිදහස් සාමකාමී ශ්‍රී ලංකාවක් වනු නොඅනුමානය.

(2) ඇතැම් සිසුහු අද පාසල් අධ්‍යාපනයට අමතරව උපකාර පන්ති කෙරේ වැඩිපුර යොමු වීමේ ප්‍රවණතාවක් පවතී. දෙමාපියන්ට මේ සඳහා විශාල මුදලක් වැය කිරීමට සිදුව ඇති අතර දරුවන්ගේ ශ්‍රමය හා කාලය වැඩි වශයෙන් මේ සඳහා කැප කිරීමට සිදු වී ඇත. පාසල් සිසුන් උපකාරක පන්ති කෙරේ යොමු වීමට බලපෑ හේතු රාශියකි. පාසල් අධ්‍යාපනය විධිමත් ව හැඩ ගැස්වීමෙන් මේ තත්ත්වයට විසඳුම් සෙවිය හැකිය.

(3) ගතට හා සිතට වෙහෙසකර අධ්‍යාපන ක්‍රමයකට අනුගත වීම හේතුවෙන් පාසල් දරුවන්ගේ සාහිත්‍යය බොහෝ දුරට ඈත් ව ගොස්ය. වැඩිහිටියන් තුළ ද සම්භාව්‍ය සාහිත්‍යයට යොමු වීමක් දක්නට නැත. වර්තමානයේ මානව සිතට සාහිත්‍යයක අවශ්‍යතාව ඉස්මතු වී පෙනේ.

(4) අප රටේ වසරක් තුළ සිදුවන ස්වාභාවික ව්‍යවසන සංඛ්‍යාව අද වන විට ඉතා ඉහළ අගයක් ගැනීම දේශගුණික විපර්යාස නිසා සිදුවන මෙම තත්ත්වයට මිනිසුන් වශයෙන් අපි වගකීම් යුත්තෝ වෙමු. පරිසරය පිළිබඳ මීට වඩා අප සංවේදී වීම තුළින් මෙම ආපදා අවම කර ගැනීමට අපට හැකි වේ.

(ලකුණු 25)

03 පහත දැක්වෙන පාඨය වචන 65 75 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

ආර්ථික විශ්ලේෂණයේ දී වෙසෙසින් උපුටා නො දැක්වෙන නමුත් සංවර්ධනයේ දී අතිශයින් වැදගත් වන තවත් සැලකිය යුතු කරුණක් නම් අද අධ්‍යාපනය සමාජ වෙනස්වීම් සඳහා සාධකයක් ලෙස බල පවත්නා ආකාරයයි. සංවර්ධනයේදී පාරම්පරික සමාජ ව්‍යුහයේ පරිණාමයක් අවශ්‍ය වෙයි. තව ද ඒ සඳහා වැඩි වේගවත් සමාජ චලතාවක් ද නව්‍යකරණයට බාධාවක් වන සිරිත්විරිත් හා ඇගයීම් බැහැර කිරීම ද අවශ්‍ය වෙයි. මේ වෙනස්කම් ඇතිකරලීමෙහි ලා අධ්‍යාපනය බලවත් උපකරණයකි. අලුත් අදහස් පැතිරවීමෙන් ද අලුත් උසස් සමාජ පන්ති පෝෂණය කරවීමෙන් ද මුළු සමාජය පුරාම නායකත්වය පිළිබඳ විවිධ රටාවන් හි වෙනස්කම් එයින් ජනිත කෙරේ. ක්‍රම සම්පාදකයෝ සංවර්ධනය හා සම්බන්ධ සමාජ හා දේශපාලන සාධක දන්නා තරමට ම සමාජ වෙනස්වීම් ඇති කරලීමේ මාධ්‍යයක් වශයෙන් අධ්‍යාපනයේ ඇති වැදගත්කම ගැන දැනගත යුත්තෝ ය.

අධ්‍යාපනය සුඛසාධක අංගයක් වශයෙන් නොව සංවර්ධනයෙහි ලා අතිශයින් උපකාරී වන්නක් සේ අද සැලකෙන්නේ නම්, එය ප්‍රබල සහ කාර්යක්ෂම ආයුධයක් බවට පත්කර ගත යුතු ය. මෙයින් අදහස් කෙරෙන්නේ අධ්‍යාපනය මුළුමනින් ම වාගේ සංවර්ධන පරමාර්ථයේ අවශ්‍යතා අනුව හැඩගස්වා ගත යුතු බවයි. මූලික වශයෙන් මේ අවශ්‍යතා දෙයාකාර වෙයි. සංවර්ධනය උසස් තලවල දී ආර්ථිකය සඳහා අවශ්‍ය වන විශේෂ දක්ෂකම් ඇතියවුන් නියත වශයෙන් ලබාදීම ඉන් පළමු වැන්න වෙයි. නවීන කාර්මික ඥානය ගැන ජනතාව තුළ පිළිගැනීමක් මෙන් ම නවීන වූත් විද්‍යාත්මක වූත් හැඟීමක් ඇතිකර ගැනීමත් සමග ම සංවර්ධන අරමුණු හා ගැළපෙන අදහස් උදහස් ඇති කිරීම දෙවැන්න වේ. දෙවැනි අවශ්‍යතාව ඉතාම වැදගත් වෙයි.කුමක් හෙයින් ද යත්, සංවර්ධනය සඳහා යොදවන ප්‍රාග්ධනය ප්‍රමාණයට වඩා සාමාන්‍යයෙන් ජනතාව ලබා ගන්නා කාර්මික දැනීම් ප්‍රමාණය මූලික වන හෙයිනි. (ලකුණු 10)

04. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

අලෙවි කළ හැකි සේවාවක් වන ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවාව පෞද්ගලික අංශයේ ආයෝජන ඉහළ යාමත් සමග තරගකාරීත්වයක් කරා ක්‍රමානුකූලව යොමුවෙමින් පවතී. මෑතකාලීනව පෞද්ගලික ආරෝග්‍යශාලා විශාල වශයෙන් බිහිවීම මගින් පෙන්නුම් කරනුයේ රාජ්‍ය අංශය ගුණාත්මක වශයෙන් උසස් සෞඛ්‍ය සේවයක් සැපයීමට අසමත් වීම නිසා එම ඉල්ලුම සපුරාලීමට ඇති වූවක් බවයි. සෞඛ්‍ය සේවා සැපයීමේ පෞද්ගලික අංශයේ දායකත්වය වර්ධනය වීමත් සමග ගුණාත්මක භාවය සහ ප්‍රමිතීන් ආරක්ෂා කිරීම පිණිස වෙළෙඳපොළ මූලික වූ නියාමන ක්‍රමයක් ස්ථාපිත කිරීම අත්‍යවශ්‍ය ය. සෞඛ්‍ය සේවා සැපයීමේ පෞද්ගලික අංශයේ සහභාගිත්වය සෞඛ්‍ය අංශයේ සමස්ත බිඳවැටීම වලක්වා ලීමට ප්‍රබල ලෙස දායක වී ඇති බව පැහැදිලිය. රාජ්‍ය සෞඛ්‍ය සේවය සතු විශාල දැනුම් සම්භාරය පෞද්ගලික අංශය වෙත මුදා හැරීම තුළින් මෙම තත්ත්වය බොහෝ දුරට සාර්ථක කරනු ලැබ ඇත. මේ අනුව රාජ්‍ය සෞඛ්‍ය සේවයට අනුයුක්ත විශේෂඥ වෛද්‍යවරුන් පෞද්ගලික සේවා සඳහා නීත්‍යානුකූලව මුදාහරිනු ලැබ ඇත. ඒ සමානව නීත්‍යානුකූල නොවුන ද රාජ්‍ය සෞඛ්‍ය සේවයේ කාර්මික ශිල්පීන්ගේ සේවය ද පෞද්ගලික අංශය විසින් සපයා ගනු ලැබ ඇත. මෙම තත්ත්වය සෞඛ්‍ය සේවය යෙදවුම් පෞද්ගලීකරණය ලෙස සැලකිය හැකි අතර ඒ තුළින් සිය පාර්ශවයන් ප්‍රතිලාභ ලබන බව පැහැදිලි වෙයි.

(1) සෞඛ්‍ය අංශයේ සමස්ත බිඳ වැටීම වළක්වාලීමට ප්‍රබල දායකත්වයක් වූයේ කුමක් ද?
(2) රාජ්‍ය සෞඛ්‍ය සේවාවේ කාර්මික ශිල්පීන්ගේ සේවය පෞද්ගලික අංශය විසින් සපයා ගැනීම සලකන්නේ කුමක් ලෙස ද?
(3) පෞද්ගලික අංශයේ ආයෝජන ඉහළ යාම සමඟ ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවාව කුමන ආකාරයක් උසුලන්නේ ද?
(4) සෞඛ්‍ය සේවයේ පෞද්ගලික අංශයේ දායකත්වය වැඩි වීමත් සමඟ ගුණාත්මක හා ප්‍රමිතීන් ආරක්ෂා කිරීමට ගත් පියවර කුමක් ද?
(5) ඡේදයට අනුව උසස් ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් සැපයීමට රාජ්‍ය අංශය අසමත් වීම නිසා සිදු වූයේ කුමක් ද?

(ලකුණු 2 x 5 = 10)

05. සිසිලගම මහා විද්‍යාලයේ විදුහල්පතිවරයකු ලෙස සේවය කොට විශ්‍රාම ලද දූෂාන් වීරතුංග මහතා ලියූ ''සෙනෙහසක මහිම'' පද්‍ය නිර්මාණ සංග්‍රහය දොරට වැඩීමේ උළෙල වත්මන් විදුහල්පතිතුමාගේ ප්‍රධානත්වයෙන් සුමිත්‍රයෝ කලා සංගමයේ මෙහෙයවීමෙන් විදුහල් ශ්‍රවණාගාරයේ දී 2019. 07 28 දින පැවැත්වීමට නියමිතය. කලාකීර්ති කිවිපති ජගත් සිලෝගම මහතාගේ දේශනයක් ද එහි දී පැවැත්වේ. එම උත්සවය සඳහා සුදුසු න්‍යාය පත්‍රයක් සකස් කරන්න.

නැතහොත්

කුණු කසළ බැහැර කිරීමේ අවිධිමත් ක්‍රියා පටිපාටිය මත ඩෙංගු රෝගය තදින් පැතිර යාම කන්දෙගම ප්‍රදේශයෙන් වාර්තාවේ. එය මර්දනය කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ගයන්, ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන්නට අවශ්‍ය කටයුතු සම්පාදනය කර දෙන ලෙස ඉල්ලා ප්‍රාදේශීය සෞඛ්‍ය අධ්‍යක්ෂවරයා වෙත යැවෙන ලිපිය සකස් කරන්න. ඔබ ප්‍රදේශයේ ප්‍රජාමූල සංගමයේ ලේකම් සහන් දේශප්‍රිය යැයි සිතන්න. (ලකුණු 15)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 11 ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය - III

**නම/විභාග අංකය :-- ..................................................................................... කාලය : පැය 02 යි**

- **උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
- **1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.**
- **මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු ගණන 80කි.**

01. අංක (1) සිට (10) තෙක් ඇති සියලුම අනු කොටස්වලට **කෙටි පිළිතුරු ලියන්න.**
කිසියම් කොටසකට ඔබ පිළිතුරු **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(1) (අ) දහම්ගැට මාලාව, එළු අත්තනගලු වංශය යන කෘතීන්හි කතුවරයා නම් කරන්න.
(ආ) හංස සන්දේශයෙහි නිමිත්ත වනුයේ කිනම් රජ කෙනකු වෙත සෙත සැලසීම ද?

(2) (අ)යූස්ටස් රෙජිනෝල්ඩ් ද සිල්වා යන නමින් හැඳින් වූ කෘතහස්ත සාහිත්‍යධරයා පසුව භාවිත කළ නම කුමක් ද?
(ආ) එතුමා රචනා කළ නවකතා දෙකක් නම් කරන්න.

(3) ගුත්තිල මහ **සිපී**
....................................
මින් දිනමැ'යි **දුපී**
....................................
(අ) මෙම පද්‍යයේ ඉතිරි දෙපදය සම්පූර්ණ කරන්න.
(ආ) මෙහි තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය වෙන වෙන ම දක්වන්න.

(4) ''ලෙඩට බේත් කොච්චර තිබුණත් කරුමෙට බේත් කියෙනවයැ''
(අ) මෙම ප්‍රකාශය කළේ කවුරුන් විසින් ද?
(ආ) මෙම ප්‍රකාශය කළේ කවුරුන් වෙත ද?

(5) ''මා උපන් තැන් පටන් ගෙනැ යැ යි කියන තැන කුකුස් ඇති විහි නම් ආර්ය ජාතීන් උපත් නැත් පටන් ගෙනැ යි කියා''
(අ) මෙම ප්‍රකාශයෙන් කියවෙන්නේ කුමක් පිළිබඳව ද?
(ආ) ''ආර්ය ජාතීන් උපන් තැන් පටන් ගෙනැ'' යන්නෙහි අදහස කුමක් ද?

(6) (අ) එච්.එම්. කුඩලිගම කුමන යුගයට අයත් කවියෙක් ද?
(ආ) එම කවි යුගයට අයත් වෙනත් කවීන් දෙදෙනෙකු නම් කරන්න.

(7) ''තොප නිසා අවුත් මෙතෙක් කල් මෙතැන වසන අපට තෙපි අමුතු පඬුරක් පමණවත් නොඑවූ විරූ ය''
(අ)'තොප' යනුවෙන් මෙහි සඳහන් වන්නේ කවුරුන් පිළිබඳව ද?
(ආ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?

(8) (අ) තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසින් රචිත කෘති දෙකක් නම් කරන්න.
(ආ) ''වන්දිමි හිමි වලා තො ගොසින් ඇය නිවෙස්නට'' යන ගීය අපට හමු වන්නේ කොහි ද?

(9) (අ) ''මෙ සිත තබා අනුන් හෙළා පිරිහෙළා කීමෙන් දුරු විය යුතු'' යන්න සඳහන් වන පාඩම කුමක් ද?
(ආ) එහි අතීත කතාවට පාදක වන සිදුවීම කුමක් ද?

(10) සිනිඳු මොළොක් බව මලෙහි
පිරිසිදු බව පිනි බිඳෙහි
(අ) ඉහත පද්‍ය කොටස ඇතුළත් පැදි පෙළේ කතුවරයා නම් කරන්න.
(ආ) එම පද්‍යය රචනා වී ඇති තේමාව කුමක් ද? (ලකුණු 2 x 10 = 20)

02. පහත දක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(1) ගනේ මිණි බැබැළි කිරණේව් **සතපාය**
රනේ යට'ග සැව්ලිඳු දද ගළපාය
අනේ **ලකර** කළ පුර අප නරපාය
පෙනේ දකුණු මහසෙන් දෙව් රද පාය

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.
(ආ) පද්‍යයේ සඳහන් උපමාවක් ලියන්න.

(2) පුන් මදාරා මල් දමින් මුදු
දිගු සුනිල් වරලස ගොතා
මන්මදා කිතු ලිය ලෙසින් උර
තුර සරා දිලි මුතු ලතා
මන් නදා වන මිණි මෙවුල් නද
වෙණ නදින් එක් කොට ඉතා
උන් එදා දුන් රඟ දුටොත් තව
සක් සැපත් කවරෙක් පතා

(අ) මෙම පද්‍යයේ සඳහන් රූපකාලංකාරය උපුටා ලියන්න.
(ආ) සුරඟනන් සැරසී සිටි ආකාරය විස්තර කරන්න.

(3) ''පුතැ අහිංසකය, කොහි සිටියෙහි? කොහි හුන්නෙහි? කොයට ගියෙහි? පුතැ, මා හා නො බෙණෙහි නො?
(අ) මෙම පාඨයෙහි අදහස සරල බසින් ලියන්න.
(ආ) මෙම පාඨය හා බැඳුණු අවස්ථාව කෙටියෙන් ලියන්න.

(4) නොයෙක් තැන ම පිපි මල් පිරුණු **පොකුණු ය**
ගෙයක් කන ම සැඳැහෙන් දෙවන දකුණු ය
සුදක් ලෙස තිබෙයි මළු මං හැර කුණුය
සියක් අය කෙරෙති වැඳ පුද **පැදකුණුය**

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න
(ආ) මෙම ගම් පියසෙහි ගැමියන් භක්තිමත් බව පෙන්වන කරුණක් සඳහන් කරන්න.

(5) ''කොල, ඉතා යහපත් වීයෙක. ඉස්නෙමි. කියා වීරියට දමාපීමි. ඒ දැක එතැන සිටි ජනයෝ මා වෙහෙසන්නාහු ''ඉතා ම බඩ සා සැටිය. කැමැත්තෙහි වී නම් තිලින් පොදියක් කොට බැඳගෙන ගොස් පැහැර පියා පිස ගෙන බඩ පුරා කා නො මිය'' යි කීහ.

(අ) මෙම පාඨය හා සම්බන්ධ අවස්ථාව ලියන්න.
(ආ) පාඨයෙහි අදහස ලිහිල් බසින් ලියන්න. (ලකුණු 4X5=20)

3. (1) ශබ්ද රසය හා අර්ථ රසය මැනවින් සංකලනය කරමින් කාව්‍යකරණයෙහි ලා තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් පෑවේ අපූර්ව දක්ෂතාවකි. මග විසිතුරු පැදි පෙළෙන් එක් කරුණකට නිදසුන් **දෙකක්** බැගින් දක්වමින් විමසන්න.

නැතහොත්

(1) උග්ගසේන සිටුපුත්
(2) විද්දත් දියණිය යන චරිත ඇසුරින් ශ්‍රාවක සිත් සතන් තුළ කුසල් අකුසල කර්මවල විපාක දැක්වීමට ධර්මසේන හිමියන් පෑ සමත්කම එක් කරුණකට නිදසුන් දෙකක් බැගින් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

4. (1) කුරහන් වගා කිරීමටත්
(2) හේන රැක ගැනීමටත් හේන් ගොවියා දරූ අපමණ වෙහෙස කුරහන් ඉසිමුව කළුවර බලාලා පැදි පෙළෙන් ධ්වනිත වේ. එක් කරුණකට නිදසුන් දෙකක් බැගින් දක්වමින් විමසන්න.

නැතහොත්

ගංගාවේ සංගීතය පැදි පෙළ සහෘද සිත් සතන් ඇද බැඳ ගන්නේ,
(1) කවියා දක්වන ජීවන දර්ශනයක්
(2) සංකල්ප රූප මැවීමේ ශක්තියත් නිසාය. එක් කරුණකට නිදසුනක් **දෙකක්** බැගින් දක්වමින් පැහැදිලි කරන්න.
(ලකුණු 15)

● **5, 6, 7 ප්‍රශ්නවලින් එකකට පමණක් පිළිතුරු සපයන්න.**

5. සහෘද සිත් සතන් ඇද බැඳ ගන්නා අයුරින් කතා කීමේ සුවිශේෂී හැකියාවක් ගුරුළුගෝමීන් සතු විය. අඟුල්මල් දමනයේ කතා රීතිය ඇසුරින් නිදසුන් **තුනක්** දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

6. සොබාදහමේ අභියෝගයන්ට මුහුණ දීමට නොහැකි වූ අසරණ ගැමියන්ගේ ජීවන රටාව පිළිබඳ විවරණයක් ලෙස බැද්දේගම නවකතාව හඳුනාගත හැකිය. උචිත නිදසුන් තුනක් ඇසුරින් විමසන්න. (ලකුණු 10)

7. විශිෂ්ට වීණා වාදනයක ස්වරූපය කියා පෑමට කවියා යොදා ගත් උපක්‍රම කෙබඳුද යි ගුත්තිල වෙණ නද පාඩමෙන් නිදසුන් **තුනක්** ඇසුරින් විමසන්න. (ලකුණු 10)

Answer

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 11 ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය - පිළිතුරු

### I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. 4 | 2. 2 | 3. 3 | 4. 1 | 5. 2 | 6. 4 | 7. 3 | 8. 1 | 9. 4 | 10. 2 |
| 11. 3 | 12. 1 | 13. 4 | 14. 2 | 15. 3 | 16. 1 | 17. 2 | 18. 4 | 19. 3 | 20. 1 |
| 21. 3 | 22. 1 | 23. 4 | 24. 2 | 25. 3 | 26. 1 | 27. 4 | 28. 2 | 29. 3 | 30. 1 |
| 31. 4 | 32. 2 | 33. 3 | 34. 3 | 35. 4 | 36. 2 | 37. 1 | 38. 4 | 39. 3 | 40. 2 |

(ලකුණු 1 x 4 = 40 යි)

### II පත්‍රය

1. උක්තාඛ්‍යාත සම්බන්ධය නිවැරදි ව ලියා ඇති අර්ථාන්විත වාක්‍ය සඳහා ලකුණු පිරිනමන්න.
2. සඳකඩ පහණ, කෞශල්‍යය
3. (අ) පත්තිරු - ද්විත්වරූප සන්ධිය (ආ) දකුණත පූර්වස්වර ලෝප සන්ධිය
4. (අ) නි (ආ) සු
5. (අ) ප්‍රසාරණය (ආ) අවමානය
6. (අ) අප්‍රමාණ / අපරිමිත (ආ) ප්‍රවේණිය
7. (අ) නුඹලා විභාගයෙන් ජය ලබනු වා!
(ආ) සුදුසුකම් සම්පූර්ණ කළ උපාධිධාරීහු අටසිය දෙනෙක් ගුරු පත්වීම් ලැබූ හ.
8. (අ) විධි ක්‍රියා (ආ) මිශ්‍ර ක්‍රියා
9. (අ) පැරණි සිරිත් / පුරාණ චාරිත්‍ර (ආ) දෙටු පුත් / ජ්‍යෝෂ්ඨ පුත්‍ර
10. ලොකු කුඩා, හුරු පුරුදු (ලකුණු 2x10=20 යි)

2. ලකුණු විග්‍රහය **මුළු ලකුණු 25 යි.**
1. සාරවත් භාවය, මාතෘකාව ද ඇතුළුව (ලකුණු 08 යි)
2. සංවිධානය, නිර්මාණාත්මක භාවය හා ස්වීයත්වය (ලකුණු 12 යි)
3. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම (ලකුණු 05 යි)

3. ලකුණු විග්‍රහය **මුළු ලකුණු 10 යි.**
1. අන්තර්ගතය (ලකුණු 06 යි)
2. වචන ගණන (ලකුණු 02 යි)
3. ශිල්පීය දක්ෂතා (ලකුණු 02 යි)

4. 1. පෞද්ගලික අංශයේ සහභාගීත්වය
2. යෙදවුම් පෞද්ගලීකරණය වශයෙනි
3. තරගකාරීත්වයක් කරා ක්‍රමයෙන් යොමු වීමකි.
4. වෙළෙඳපොළ මූලික වූ නියාමනයක් ස්ථාපිත කිරීම
5. පෞද්ගලික ආරෝග්‍යශාලා ලෙස බිහි වීම (ලකුණු 2 x 5 = 10 යි)

5. ලකුණු විග්‍රහය **මුළු ලකුණු 15 යි.**
ආකෘතිය (ලකුණු 05 යි)
අන්තර්ගතය (ලකුණු 07 යි)
ශිල්පීය දක්ෂතා (ලකුණු 03 යි)

### III පත්‍රය

1. (1) (අ) වීදාගම මෛත්‍රේය හිමි
(ආ) හය වන පරාක්‍රමබාහු රජතුමාට / සිරි පැරකුම්බා රජ
(2) (අ) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර
(ආ) මළගිය ඇත්තෝ, මළවුන්ගේ අවුරුදු දා ආදී....

(3) (අ) සක්දෙව් බසින් සැතපී
බමර තත පළමුවෙන් සිඳපී
(ආ) සිපී - ශිල්පියා
දපී - එඩිතරව
(4) (අ) පුංචිරාළ / වෙදරාළ
(ආ) පුංචි මැණිකා
(5) (අ) මූඪගර්භ ස්ත්‍රියට සත්‍ය ක්‍රියා කිරීම පිළිබඳ ව
(ආ) පැවිදි වූ තැන් පටන් ගෙන / භික්ෂු ශාසනයට ඇතුළත් වූ තැන් සිට
(6) (අ) කොළඹ යුගය
(ආ) පී.බී. අල්විස් පෙරේරා, කපිල සෙනෙවිරත්න, මාකඳුරේ ගුණවර්ධන, මීමන ප්‍රේමතිලක, උපනන්ද බටුගෙදර ආදී
(7) (අ) මහෞෂධ පඬිතුමා
(ආ) කේවට්ටාචාරී
(8) (අ) සැලලිහිණි සන්දේශය, පරෙවි සන්දේශය, බුද්ධි ප්‍රසාදිනී, පංචිකා ප්‍රදීපය, කාව්‍යශේඛරය
(ආ) සීගිරි ගීවල
(9) (අ) උග්ගසේන සිටුපුත්හුගේ වස්තුව
(ආ) බරණැස් නුවර වැසියන් කාශ්‍යප බුදුරදුන්ට රන් දා ගැබක් ඉදි කරන අවස්ථාවේ වූ සිද්ධියක්.
(10) (අ) ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි (ලකුණු 2 x 10 = 20)
(ආ) දේශානුරාග හා ජාතිකාභිමාන කවි

2. (1) (අ) සූර්යයා, අලංකාර (ආ) කිරණ වැනි
(2) කිතුලිය
(ආ) පිපුණු මදාරා මල් දමින් මෘදු වූ ඉතා දික් වූ ඉතා නිල් වූ කෙස් කළඹ ගොතා ගෙන අනංගයාගේ කීර්ති ලතාව මෙන් දිලිසෙන්නා වූ මුතු වැලින් ළය මැද සරසා ගෙන

3. (අ) ''පුතා අහිංසක, සිටින්නේ කොහි ද? සිටියේ කොහි ද? කොහේට ගියේ ද? පුතා මා සමග කතා නොකරන්නේ චේද?''
(ආ) අඟුල්මල් දමනයෙහි සඳහන් අඟුල්මල් බුදුන් වහන්සේ අතින් පැවිද්ද ලැබූ පසු මන්තාණි බැමිණිය තම පුතු සොයා වනාන්තරයට ගිය අවස්ථාව.

4. (අ) දකුණු දාන පැදකුණු ප්‍රදක්ෂිණා
(ආ) ගෙයක් පාසා ශ්‍රද්ධාවෙන් දන් දීම සිය ගණන් පිරිස් වැදීම් පිදීම් ප්‍රදක්ෂිණා කිරීම

5. (අ) උම්මග්ග ජාතකයේ යුද්ධෝපාය යෙදීම නම් අංගයෙහි කේවට්ට බමුණාගේ උපදෙස් මත චූලනී බ්‍රහ්මදත්ත රජු වී සාල් මියුලුනුවර ඇතුළු නුවර වැද්ද නුදුන් කල්හි මහෞෂධ පඬිතුමාගේ චර පුරුෂයෙක් චූලනී රජු අමතා කළ ප්‍රකාශයක්.
(ආ) බොල ඉතා හොඳ වී වර්ගයකි. ඉසින්නෙමි යි කියා මාර්ගයට දැමීමි. එය දුටු එතැන සිටි ජනතාව මා පීඩාවට පත් කරන්නෝ (ඔබට) ඉතා කුසගිනි වාගේ ය. කැමති නම් ඔයින් පොදියක් බැඳ රැගෙන ගොස් වී කොටා ගෙන බත් පිස බඩ පිරෙන තුරු කා ජීවත් වන්න. (ලකුණු 4 x 5 = 20)

3/4 ප්‍රශ්න සඳහා එක් ප්‍රශ්නයකට {
නිදසුන් 4 ක් සඳහා ලකුණු 4
සමස්ත විස්තරයට ලකුණු 11
**මුළු ලකුණු 15x2 = 30 යි.**

5/6/7 එක් ප්‍රශ්නයක් සඳහා {
නිදසුන් 3 ක් සඳහා ලකුණු 3
සමස්ත විස්තරයට ලකුණු 7
**මුළු ලකුණු 10 යි.**